# පත්තිනි දේව ඇදහිල්ල හා බැඳි විශ්වාස හා ආකල්ප මිනිස් ජීවිතයට එල්ල කර ඇති බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.ඩී.එම්.ඩී. මධුෂානි

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
malkidinesha5@gmail.com

**මුඛ්‍ය පද** - පත්තිනි ඇදහිල්ල, පිටුවහල, බැතිමතුන්, යුක්තිගරුක බව, සමාජයක්.

## හැඳින්වීම

ප්‍රාථමික ගැමියන් තම ජීවිතයේ අවශ්‍යතා සපුරා ගැනීමට දෙවියන් කෙරෙහි අචල විශ්වාසයන් තබාගනිමින් කල් ගත කර ඇත. එම දේව සමූහයා අතරින් ගැමියන් වැඩි වශයෙන් පුදසත්කාර පැවැත්වීමට එක්රොක් වූයේ පත්තිනි දේව සංකල්පය වටාය. විශේෂයෙන්ම ලෙඩරෝග දුරු කරගැනීම සඳහා, ගම්වල සියලුදෙනාම එක්රැස් වී ගමට සෙත් පැතීම සඳහා, ගමේ සාමය හා සහයෝගය වර්ධනය කර ගැනීම ආදී අරමුණු පෙරදැරි කරගනිමින් පත්තිනි දේව ඇදහිල්ල සිදුකරයි. පත්තිනි දේව ඇදහිල්ල ගජබා රජු සමය දක්වා ඈත අතීතයට දිවයයි. තවද පත්තිනි ඇදහීම ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ සිට අප රටට සංක්‍රමණය වූවක් ලෙස පෙන්වා දිය හැකි ය. නමුත් වර්තමානය වන විට පත්තිනි දේව සංකල්පය ශ්‍රී ලාංකේය බෞද්ධ ජනතාව ඉතාමත් හරසරින් වැළඳගෙන හමාරය. ඒ පත්තිනි දේවතාවිය සතු උත්තරීතර ගුණ කදම්බය නිසාවෙනි. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටළුව පත්තිනි දේව ඇදහිල්ල හා බැඳි විශ්වාස හා ආකල්ප මිනිස් ජීවිතයට එල්ල කර ඇති බලපෑම කෙබඳු ද? යන්නයි.

## ක්‍රමවේදය

පත්තිනි දේව සංකල්පය මානව චර්යාවන් හට කෙබඳු අයුරින් බලපානවා ද යන පර්යේෂණ ගැටළුවට අදාළව සිදු කරනු ලබන මෙම පර්යේෂණ අධ්‍යයනයට අවශ්‍ය දත්ත රැස් කිරීම උදෙසා පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය හා ක්ෂේත්‍ර අධ්‍යයනය උපයෝගී කර ගන්නා ලදී. පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ද්විතීක මූලාශ්‍ර පරිශීලනයෙන් දත්ත ලබා ගන්නා ලදී. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යටතේ මීගමුව, හලාවත යන ප්‍රදේශ අධ්‍යයන ප්‍රදේශ ලෙස තෝරාගත් අතර එහිදී අහඹු නියැදි ක්‍රමය යටතේ පුද්ගලයින් තිහක පිරිසක් තෝරා ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රම යටතේ දත්ත ලබා ගන්නා ලදී. එම ලබාගත් දත්ත අදාල කාණ්ඩවලට වෙන්කරමින් තේමාකරණය යටතේ දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම සිදු කරන ලදී. එම දත්ත සංසන්දනය කරමින් අවසාන වශයෙන් නිගමනවලට පැමිණීමට කටයුතු කර ඇත.

## සාකච්ඡාව

පති භක්තිය යනු තම ස්වාමියාට පමණක් කැපවීම යන්නයි. පෙරදිග සංස්කෘතියට උරුමකම් කියන රටක් වන ශ්‍රී ලංකාව තුළද පති භක්තිය යන සංකල්පය ඉතාමත් ගරුත්වයෙන් පිළිගනියි. පති භක්තියේ බලය පෙන්වමින් දිව්‍යත්වය පත් දේවතාවියක් ලෙස පත්තිනි මෑණියන් සැවොගේම ගෞරවාදරයට පාත්‍ර වී ඇත. එම නිසා පත්තිනි දේව සංකල්පය ඇදහිම මඟින් ජන සමාජයට ද ඉතා වැදගත් පුරුදු රාශියක් දායාද වෙයි. ප්‍රධාන වශයෙන් ම කාන්තාවක් සතුව පැවතිය යුතු පිරිසිදු බව යන සංකල්පය, කාන්තාවන්ට කාමය වරදවා හැසිරීම කිසිසේත්ම නොසුදුසු බව පත්තිනි සංකල්පයේ මූලික හරය වෙයි. මේ තුළින් කාන්තාවන් පත් භක්තිය ඇතිව කටයුතු කිරීමට යොමු වීම සමාජයට යහපතකි.

පත්තිනි දේව ඇදහිල්ල පති භක්තිය යන සංකල්පයට පමණක් සීමා නොවී මුළු මහත් රටවැසියන්ගේ ම නිරෝගී බව සහ සශ්‍රීකත්වය අරමුණු කරගනිමින්ද වර්තමානය වන විට වර්ධනය වී ඇත. ගම්මඩුව සහ පහන්මඩුව යනු පත්තිනි මෑණියන් වෙනුවෙන් ඉටු කරන

පූජා විධියකි. මෙම පූජා ක්‍රම තුළින් මුළු මහත් සමාජයේ ම නිරෝගී බව හා සශ්‍රීකත්වය අපේක්ෂා කරයි. ඒ අනුව ආත්මාර්ථකාමී සංකල්පය දුරලමින් පරාර්ථකාමීව කටයුතු කිරීම පත්තිනි දේව ඇදහිල්ල හා බැඳි පූජාවිධි මං පෙත් සලසන බව පෙනීයයි.

එම පූජා විධි වලට අමතරව පත්තිනි දේව සංකල්පය හා බැඳි ජන ක්‍රීඩා රාශියක් ද පවතින බව ගැඹුරු සම්මුඛ සාකච්ඡා වලදී අනාවරණය විය. එම ක්‍රීඩා අතර ඔලිඳ කෙළිය, අං කෙළිය සහ පොරපොල් ගැසීම ඉතා ජනප්‍රිය බවත් තවමත් එම ක්‍රීඩා සිදු කිරීම ද වන බවත් අනාවරණය විය. මෙලෙස ක්‍රීඩා කිරීමේ අපේක්ෂාව ශරීරයේ නිරෝගී බව පවත්වා ගැනීම බව දත්ත දායකයෙක් පවසන ලදී. නිරෝගීව සිටීමට ක්‍රීඩාව ශරීරයට අවශ්‍ය ම දෙයකි. ඒ අනුව මෙම පත්තිනි දේව ඇදහිල්ල හා බැඳි ජනක්‍රීඩා තුළින් ද මිනිසාගේ නිරෝගී බව ආරක්ෂා වන බව පෙනීයයි.

එපමණක් නොව පත්තිනි මෑණියන් වෙනුවෙන් දෙනු ලබන කිරි අම්මා දානය, මල්කුමාරි දානය, මල්කුමාර දානය තුළින් ද අපේක්ෂා කරනුයේ නිරෝගිබව හා සෞභාග්‍යය බව දත්ත දායකයන්ගේ ප්‍රකාශන තුළින් පැහැදිලි විය. ඒ අනුව මානව වර්ගයාට යහපත් අයුරින් බලපෑම් සිදු කිරීමට පත්තිනි දේව සංකල්පය උපකාර වී ඇති බව පෙන්වා දිය හැක.

ලංකාවාසී ජනතාවට පත්තිනි දේව ඇදහිල්ල හේතුවෙන් යහපත් කරුණු රාශියක් ඉගෙන ගැනීමට අවස්ථාව උදා වී ඇත. මිනිසාගේ සාරධර්මවලට හා ආකල්ප වර්ධනයට බලපාන ලද චාරිත්‍ර වාරිත්‍ර රාශියක් පත්තිනි දේව ඇදහිල්ල තුළ ගැබ් වී ඇත. රට වැසියන්ගේ නිරෝගී බව, රටේ සාමය, කලට වේලාවට වැසි ඇතිවීම, ගොවිතැන සරුසාර වීම, රටේ සෞභාග්‍ය උදා වීම ආදි අරමුණු පෙරදැරි කර ගෙන ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් පත්තිනි මෑනියන් ඇදහීම සිදු කරනු ලබයි. ජනයා පත්තිනි මෑණියන් වෙනුවෙන් පුද පූජා පවත්වන අවස්ථාවල දී මස්, මාළු අනුභවයෙන් තොරව එම පුද පූජා පැවැත්වීමට පවා ජනයා කටයුතු කර ඇත්තේ පත්තිනි මෑණියන් කෙරෙහි පවතින දැඩි භක්තිය නිසාවෙන් බවට පෙන්වා දිය හැක. ඒ අනුව පත්තිනි දේව ඇදහිල්ල හා බැඳි විශ්වාසයන් තුළින් මිනිස් සමාජය ලෞකික වශයෙන් මෙන් ම ලෝකෝත්තර වශයෙන් ද දියුණුවට පත් වෙන බව අවසන් විග්‍රහයේ දී නිගමනය කළ හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ගුණසේන, අයි. ඩී., (2016) ***පත්තිනි පූජාව සහ ශාන්තිය***, නුගේගොඩ, මොඩන් පොත් සමාගම.

හල්පෙ, එච්. එම්. පී., (2011) ***පත්තිනි දෙවියෝ,*** දංකොටුව වාසනා පොත් ප්‍රකාශකයෝ.

දසනායක, ඒ., (2002) ***පත්තිනි උපත,*** නුගේගොඩ, මොඩන් පොත් සමාගම.